ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය / எனது இல. / My No.

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2021 - 12 - 20

| | | | |
|---|---|---|---|
| පැමිණිලි පාර්ශවය | : | 01. | එච්.පී.ගුණවර්ධන මිය |
| | | 02. | එස්.කේ.සමරකෝන් මහතා, |
| | | 03. | ජේ.වැවේගෙදර මහතා<br>ජාතික සමුපකාර සංවර්ධන ආයතනය,<br>පොල්ගොල්ල. |
| වගඋත්තර පාර්ශවය | : | 01. | අධ්‍යක්ෂ ජනරාල්,<br>කළමණාකරන සේවා දෙපාර්තමේන්තුව,<br>මහා භාණ්ඩාගාරය, කොළඹ 01. |
| | | 02. | අධ්‍යක්ෂ ජනරාල්,<br>ජාතික සමුපකාර සංවර්ධන ආයතනය,<br>පොල්ගොල්ල. |

පැමිණිලි අංකය : එච්ආර්සී/කේ/492/20/අයි

**පැමිණිල්ලේ කරුණු දැක්වීම :**

1. පැමිණිලිකාර එච්.පී.ගුණවර්ධන මිය තම පැමිණිල්ල මගින් සඳහන් කර සිටින්නේ, තමා පොල්ගොල්ල ජාතික සමුපකාර සංවර්ධන ආයතනයේ සේවා සහායක ලෙස 2003 වසරේ බඳවා ගත් බවත්, 2005 වසරේ දි එම තනතුරේ ස්ථිරත්වයට පත් වූ බවත්, තම රාජකාරියට අමතරව කාර්යය මණ්ඩලයේ නිවාඩු, නිවාස ගොනු පවත්වාගෙන යාම, වාහන නඩත්තු හා අළුත්වැඩියා කිරීම්වලට අදාල රාජකාරී කර ඇති බවත්ය.

ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R. A. De Mel Mawatha, Colombo - 04.
දුරකථන / தொலைபேசி / Telephone: 94 -11- 2505580 / 81 / 82
සභාපති / தவிசாளர் / Chairperson: 011-2505451
ලේකම් / செயலாளர் / Secretary: 011-2505521
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541 / 74
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 1996
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrcsl@gmail.com
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

2. දෙවන පැමිණිලිකරු වන S.K. සමරකෝන් මහතා පොල්ගොල්ල ජාතික සමූපකාර සංවර්ධන ආයතනයේ සේවා සහයක ලෙස අවුරුදු 15 ක් පමණ තම රාජකාරිය සිදුකළ බවත්, ඊට අමතරව ලේඛණාගාර භාරකරු, විදුලි ජනක යන්ත්‍ර ක්‍රියාකරු, නේවාසිකාගාර සහකාර ලෙස සේවය කරන බවත් පැමිණිල්ලේ සඳහන් කර ඇත.

3. තුන්වන පැමිණිලිකරු වන ජයන්ත වැවේගෙදර මහතා කොමිෂන් සභාව වෙත තම පැමිණිල්ල මඟින් ප්‍රකාශ කර සිටින්නේ, පොල්ගොල්ල ජාතික සමූපකාර සංවර්ධන ආයතනයේ සේවා සහායක ලෙස අවුරුදු 15 ක් පමණ සේවය කරමින් එම රාජකාරියට අමතරව විදුලිජනක යන්ත්‍ර ක්‍රියාකරු හා තාවකාලික රියදුරු ලෙස සේවය කරන බවයි.

පැමිණිලිකරුවන් තවදුරටත් කරුණු දක්වමින් සඳහන් කර සිටින්නේ, තම ආයතනය ව්‍යවස්ථාපිත ආයතනයක් වශයෙන් 2014 වසරේදි ප්‍රතිව්‍යුහ ගත කිරීම ආරම්භ කරනු ලැබූ බවත්, අභ්‍යන්තර කාර්ය මණ්ඩලයේ ඒ ඒ සේවා ගණයන් හි නිලධාරින් ඔවුන්ගේ සුදුසුකම් හා සේවා කාලය මත නව තනතුරු වල හා නව වැටුප් තලවල පිහිටවනු ලැබූ හා සේවා සහායකයන් ලෙස වසර 15 කට වැඩි කාලයක් රාජකාරි ඉටුකරන ලද අභ්‍යන්තර සේවකයන් කළමණාකරන සහකාර තනතුරු වලට උසස් කිරිම සඳහා රාජ්‍ය කළමණාකරන සේවා දෙපාර්තමේන්තු විසින් ජාතික සමූපකාර සංවර්ධන ආයතනයේ අනුමත කරන ලද ව්‍යවස්ථාවේ "අ" අධ්‍යාපන සුදුසුකම් ලෙස අ.පො.ස (සාමාන්‍ය පෙළ) විභාගයෙන් සිංහල/දෙමළ, ගණිතය, ඉංග්‍රීසි යන විෂයන් ඇතුළු සම්මාන 04ක් සමඟ විෂයන් 06 ක් එකවර සමත් වී යුතු යැයි යන්න සඳහන් කර ඇති බවත්, තමන් තිදෙනා එම සුදුසුකම් සපුරා නොතිබූ හෙයින් එකී තනතුරට ඉල්ලුම් කිරීමට නොහැකි වූ බවත්ය. නමුත් දකුණු පළාත් කාර්මික සංවර්ධන අධිකාරිය එම තනතුරු සඳහා ඉහත සඳහන් අධ්‍යාපන සුදුසුකම් නොසලකා බඳවා ගැනීම් සිදුකර ඇති බව තමන් දැනගත් බැවින්, ඒපිළිබඳ සලකා බැලිම සඳහා ජාතික සමූපකාර සංවර්ධන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරයාට කරන ලද අභියාචනය අනුව අධ්‍යක්ෂ ජනරාල් විසින් අවස්ථා කිහිපයකදීම අදාළ තනතුරේ අදාළ සුදුසුකම් අඩු කර බඳවා ගැනීම් පටිපාටිය සංශෝධන කිරීමට අනුමැතිය ලබාදෙන ලෙස අවස්ථා කිහිපයකදීම සාධාරණීයකරන වාර්තාවන් සමඟ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමු කොට ඇති බවත්ය. ඒ අනුව ඊට ප්‍රතිචාර ලෙස කළමණාකරන සේවා දෙපාර්තමේන්තුව දැනුම් දී ඇත්තේ එය අනුමත කල නොහැකි බවත්ය.

නමුත් 2014 .04.30 දින දකුණු පලාත් සංවර්ධන අධිකාරියේ සුදුසුකම් මත ජාතික සමූපකාර සංවර්ධන ආයතනයේ සේවකයෙකු කලමනාකරණ සහකාර තනතුරට අන්තර් ග්‍රහණය කර ඇති නමුත් එම

වකවානුවේද පැමිණිලිකරුවන් එකී තනතුරට අන්තර් ග්‍රහණය කිරීමට ඉඩ තිබුණද, එසේ නොකිරීමෙන් සමූපකාර සංවර්ධන ආයතනය හා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව පැමිණිලිකරුවන්ගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝන කර ඇති බවත්, ඒ අනුව පහත සහනයන් ලබාදීමට පියවර ගන්නා ලෙසත් කොමිෂන් සභාව මගින් වැඩිදුරටත් ඉල්ලා ඇත. ඒ අනුව,

01. ජාතික සමූපකාර සංවර්ධන ආයතනය හා සමාන ආයතනයක් වන දකුණු පළාත් සංවර්ධන ආයතනය හා හෝමියෝපති වෛද්‍ය සභාවට බඳවා ගෙන ඇති අභ්‍යන්තර අයදුම්කරුවන්ගේ සුදුසුකම් අනුව, තමන් තිදෙනාව කළමණාකරන සහකාර තනතුරට උසස් කරන ලෙසත්,

02. කාර්මික සංවර්ධන අධිකාරියේ බඳවා ගැනීම් පටිපාටියෙහි 5.4 වගන්තිය හා කළමණාකරන සේවා දෙපාර්තමේන්තුවේ 5.4 වගන්තිය අනුව අභ්‍යන්තර අයදුම්කරුවන් ව්‍යුහගත පරීක්ෂණයෙන් බඳවා ගැනීමටත්,

03. ඊට සාධාරණය ඉටුවන තෙක් කළමණාකරණ සහකාර තනතුර සඳහා බඳවා ගැනීම් නතර කිරීමටත්,

04. කළමණාකරණ තනතුරට 2014.04.30 වන දින ඉහත සේවා ව්‍යවස්ථාවට පිටින් අන්තර්ග්‍රහණය සිදුකර ඇති නිසා තම උසස්වීම් ද 2014.04.30 වන දිනට පෙරදාතම් කරන ලෙසත්ය.

**වගඋත්තර පාර්ශවයේ කරුණු දැක්වීම :**

- **දෙවන වගඋත්තරකාර ජාතික සමූපාකාර සංවර්ධන ආයතනයේ කරුණු සැලකිරීම් :**

දෙවන වගඋත්තරකරු වන සමූපකාර සංවර්ධන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා කොමිෂන් සභාව වෙත වාර්තාවක් යොමු කරමින් සඳහන් කර සිටින්නේ, තම ආයතනයේ පත්වීම් බලධාරියා කළමණාකරණ සේවා මණ්ඩලය බවත්, ඒ අනුව අභ්‍යන්තර තනතුරු හා බඳවා ගැනීම් අනුමත කරනු ලබන්නේ, කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් බවත්ය. අදාළ පැමිණිලි පාර්ශවයන් 2005/2006 වසර වල සේවා සහායකයින් ලෙස සේවය ස්ථිර වී කළමණාකරණ චක්‍ර ලේඛන 30 හා 2009.09.22 අනුව තම ආයතන ප්‍රතිව්‍යුහ ගතකරණය කර තනතුරු 76 කින් යුතු නව කාර්ය මණ්ඩලයක්

අනුමත කර ඇති බවත්, මෙම පැමිණිලි පාර්ශවය 2014.04.30 දින සිට බලපැවැත්වෙන පරිදි කාර්යාල කාර්යය සහායක ලෙස අන්තර්ග්‍රහනය කරන ලද බවත්ය. කළමණාකරන සේවා චක්‍ර ලේඛන 30 අනුව අන්තර්ග්රහනය කරන ලද එම සේවකයින් කළමණාකරණ සහකාර තනතුර සඳහා එම නිලධාරින්ට පෞද්ගලික වන සේ අභ්‍යන්තර උසස්වීම් ලබාදෙන ලෙසත්, කළමණාකරන සහකාර තනතුරු සඳහා අධ්‍යාපන සුදුසුකම් අඩු කරන ලෙසත්, කරන ලද ඉල්ලීම සලකා බලා කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත 2017.01.05, 2017.08.10 හා 2017.08.18 දිනයන්හිදී ඉල්ලීම් කලද ඊට මෙතෙක් අනුමැතිය ලබාදී නොමැති බවත්ය.

තවද, මෙම ගැටළුව ආයතනික කළමණාකරන මණ්ඩලයට යොමු කරන ලද අතර, ඒ අනුව අධ්‍යාපන සුදුසුකම් අඩුකර බඳවා ගැනිම් පටිපාටිය සංශෝධනය සඳහා අනුමැතිය ලබාදුන් අතර, නමුත් 2019.08.08 කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමු කල ද ඊට ද අනුමැතිය ලබාදී නොමැති බවත්ය.

එසේම ආයතනයේ කළමනාකරණ සහකාර තනතුරු පුරප්පාඩු සඳහා කළමණාකරන සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය මත පුරප්පාඩු 06ක් සඳහා බඳවා ගැනීමට අයදුම්පත් කැඳවා ඇති අතර, තරඟ විභාගයක් පවත්වා ඉන් සමත්වීම මත සම්මුඛ පරීක්ෂණ පවත්වා ඉදිරියේදී බඳවා ගැනිමට නියමිත බවත්, අනුමත කළමණාකරන සහකාර තනතුරු 10න් 08 ක්ම දැනට පුරප්පාඩු පවතින බැවින්, අනුමැතිය ලද තනතුරු 06ක් සඳහා කඩිනමින් බඳවා ගතයුතුව ඇති බවයි.

එසේම, තම ආයතනයේ තනතුරු 32ක් සඳහා නිලධාරින් 71 දෙනෙකු අනුමත වී ඇති අතර, සෑම තනතුරක් සඳහාම බඳවා ගත යුත්තේ බාහිර හා අභ්‍යන්තර අයදුම්කරුවන්ගෙන් විවෘත අයදුම්පත් කැඳවීමෙන් බවත්, ඒ අනුව ආයතනික නිලධාරින්ට ඉහළ තනතුරු සඳහා අභ්‍යන්තරික උසස්වීම් ක්‍රමවේදයක් බඳවා ගැනීම් පටිපාටියේ අනුමත වී නොමැති අතර, සේවා ව්‍යවස්ථාව අනුව පමණක් කටයුතු කරනු ලබන බවත්ය. මෙම ගැටළුවට ආයතනික මට්ටමින් සාධාරණයක් කිරීම සඳහා උපරිම ක්‍රියාමාර්ග ගත් බවත්, ඊට අදාල ලේඛන ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂමට ඉදිරිපත් කර ඇති බවත්, මෙම තිදෙනාට සහන සැලසීම සඳහා උපරිම උත්සාහ ගෙන ඇති බවත්, ඉදිරියේදී මානව හිමිකම් කොමිෂන් සභාව විසින් නිර්දේශයක් ලබා දෙන්නේ නම්, ඒ අනුව කටයුතු කිරිමට තම ආයතනය උපරිම සහාය ලබාදෙන බවත් ලේඛකාධිකාරී ඒ.එම්.ජී.බී.අබේසිංහ මහතා පරීක්ෂණයේදී තවදුරටත් සඳහන් කර ඇත.

- **පළාත් වගඋත්තරකාර කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුවේ කරුණු සැලකිරීම :**

කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුව 2021.12.10 දින පැවති පරීක්ෂණය සඳහා සහභාගි නොවූ අතර, එහි සහකාර අධ්‍යක්ෂිකා ප්‍රනාන්දු මහත්මිය විසින් කරන ලද දුරකථන සංවාදය හා පැමිණිල්ලට

අදාළව කොමිෂන් සභාවට යොමු කරන ලද ලිඛිත වාර්තා අනුව සඳහන් කර ඇත්තේ, කළමණාකරණ සහකරුවන් ලෙස බාහිර හා අභ්‍යන්තර අයදුම්කරුවන් බඳවා ගැනීමේදි පොදු ප්‍රතිපත්තියක් අනුගමනය කරන බවත්, මෙම ගැටළුවට පාදක වී ඇති සමුපකාර සංවර්ධන ආයතනය හා දකුණු පලාත් කාර්මික සංවර්ධන අධිකාරියේ බාහිර හා අභ්‍යන්තර අයදුම්කරුවන් බඳවා ගැනීමේ දී ද සමාන ප්‍රතිපත්තියක් අනුගමනය කර ඇති නමුත් තම දෙපාර්මේන්තුවේ මුද්‍රණ දෝෂයක් හේතුවෙන් අභ්‍යන්තර කළමණාකරණ සහකරුවන්, දකුණු පලාත් කාර්මික සංවර්ධන අධිකාරියට බඳවා ගැනීමේදි අධ්‍යාපන සුදුසුකම් සඳහන් නොවී එනම්, (අ) වගන්තිය සඳහන් නොවී බඳවා ගැනීම් පටිපාටිය සකස් වී ඇති බවයි. මෙම ගැටළුව උද්ගත වීමෙන් පසු ඒ බව දැනගැනීම හේතුවෙන් ඉදිරියේ දී එය සංශෝධනය කිරීමට කටයුතු කරන බවත්ය.

**නිරීක්ෂණ සඳහා උපයෝගි කරගත් ලේඛන -**

1. ජාතික සමුපකාර සංවර්ධන ආයතනයේ සේවා ව්‍යවස්ථාව
2. දකුණු පළාත් කාර්මික සංවර්ධන අධිකාරියේ සේවා ව්යවස්ථාව
3. වෛද්‍ය සභාවේ සේවා ව්‍යවස්ථාව
4. රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛණ 25/2014
5. ජාතික සමුපකාර සංවර්ධන ආයතනයේ කළමණාකරන රැස්වීම් 122 හා 124
6. ගැටළුවලට අදාල කළමණාකරන සේවා දෙපාර්තමේන්තුව විසින් කොමිෂන් සභාව වෙත යොමු කරන ලද වාර්තා හා ලිඛිත ව්‍යවස්ථා ලේඛණ
   i. මානව හිමිකම් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කල වාර්තාව
   ii. පොදුවේ කළමණාකරන සහාකාරවරු බඳවා ගැනිමේදි අනුගමනය කරන සේවා ව්‍යවස්ථාව.
   iii. සමුපකාර සංවර්ධන ආයතනයේ බඳවා ගැනීම් පටිපාටිය.
   iv. දකුණු පළාත් සංවර්ධන ආයතනයේ බඳවා ගැනිම් පටිපාටිය

**නිරීක්ෂණ :**

- මෙම පැමිණිල්ලේ පැමිණිලිකරුවන් තිදෙනා විසින් කොමිෂන් සභාව වෙත පැමිණිල්ලක් යොමු කරමින්, පොල්ගොල්ල ජාතික සමුපකාර සංවර්ධන ආයතනයේ "ප්‍රාථමික ශිල්පීය නොවන" සේවා ගණයේ කාර්යාල සහායක තනතුරු දරන්නන් "කළමණාකරන සහකාර" (තාක්ෂණික නොවන) සේවා ණයෙන් "කළමණාකරන සහකාර" තනතුර සඳහා අභ්‍යන්තර අයදුම්කරුවන් ලෙස අයදුම් කිරීමට හැකිවන පරිදි අනුමත බඳවා ගැනීම් පටිපාටියේ, සුදුසුකම් හා බඳවාගැනිම් ක්‍රමවේදය සාධාරණ ලෙස සංශෝදනය කිරීම සිදුකරන ලෙසට ඉල්ලීමක් කර ඇති බව නිරීක්ෂණය වේ.

- මෙම ගැටළුව උද්ගතව ඇත්තේ, 2014 වසරේදී වන අතර, ජාතික සමුපකාර සංවර්ධන ආයතනය කළමණාකරන සේවා චක්‍ර ලේඛණ 30 හා 2006.09.22 වන දින ප්‍රතිව්‍යුහගත කිරීමෙන් අනතුරුව අදාල ආයතනයේ තනතුරු කිහිපයක් ඔවුන්ට පෞද්ගලික වන සේ, අනුමත කරන ලද බවත්, පැමිණිලිකරුවන් තිදෙනා ජාතික සමුපකාර සංවර්ධන ආයතනයේ සේවා සහයකයින් ලෙස සේවයට බැඳි කළමණාකරන සේවා දෙපාර්තමේන්තුවේ අනුමත බඳවා ගැනිම් පටිපාටිය අනුව 2005.07.01 වන දින ඩබ්.එච්.පී.ඩී.ගුණවර්ධන මියත්, 2006.05.02 වන දින එස්.කේ.සමරකෝන් මහතා හා එස්.එම්.ජී.බී.වැවේගෙදර මහතා සේවා ස්ථිරත්වයට පත්කරන ලදී. තවද කළමණාකරන සේවා චක්‍ර ලේඛණ 30 හා 2006.09.22 වන දිනැති කළමණාකරන චක්‍ර ලේඛණය පරිදි සමුපකාර සංවර්ධන ආයතනයේ ප්‍රතිව්‍යුහ ගතකරන ලද අතර, නව කාර්ය මණ්ඩලයේ අනුමත කිරිමට අනුව පැමිණිලි පාර්ශවයන් 2014.04.30 සිට බලපැවැත්වෙන පරිදි කාර්යාල කාර්ය සහායක ලෙස අන්තර්ග්‍රහණය කර ඇත.

- අදාල ආයතනය ප්‍රති ව්‍යුහගත කිරිමේදී මෙම අයවලුන් සේවා සහායකයන් ලෙස සේවයේ යෙදී සිට එම කාර්යයන්ට අමතරව කළමණාකරන සහකාර රාජකාරී ඉටුකිරිම හේතුවෙන් හා සමුපකාර සංවර්ධන ආයතනයට සමාන හා සමාන තනතුරු සඳහා අඩු සුදුසුකම් මත කළමණාකරන සහකාර තනතුරුවලට උසස්විම් ලබාදී තිබිම හේතුවෙන් මෙම සේවකයන් තිදෙනාද අභ්‍යන්තර අයදුම්කරුවන් ලෙස කළමණාකරන සහකාර තනතුරු සඳහා අයදුම්කර ඇත. නමුත් සමුපකාර සංවර්ධන ආයතනයේ සේවා ව්‍යවස්ථාව අනුව එම තනතුරු සඳහා සුදුසුකම් සපුරා නොමැති බැවින් අයදුම්පත්‍රය ප්‍රතික්ෂේප වී ඇත.

සමුපකාර සංවර්ධන ආයතනයේ 2013.09.24 වන දින සේවා ව්‍යවස්ථාවෙන් 5(ii) අනුව කළමණාකරන සහකාර නිලධාරින් බඳවාගැනිම් පටිපාටිය පහත පරිදි වේ.

5 (ii) අභ්‍යන්තර අයදුම්කරුවන්

(අ) ප්‍රථමික ශිල්පීය නොවන අර්ධ ශිල්පීය හා ශිල්පීය සේවා ගණයන් හී පහත (ආ) (ඇ) සහ (ඊ) සඳහා සුදුසුකම් ඇති සේවකයන් අයදුම්කල හැක.

(ආ) අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී සිංහල/දෙමළ, ගණිතය, ඉංග්‍රිසි (තත් කාර්ය සඳහා අවශ්‍ය නම්) ඇතුළුව විෂයයන් 06කින් සමත් වී තිබිම හා අවම වශයෙන් එයින් විෂයන් 03ක් සඳහා සම්මාන ලබා තිබිම.

(ඈ) සේවයේ ස්ථිර පත්වීම් දැරිය යුතු අතර, එම පත්වීම්වල ස්ථිර කරනු ලැබ සිටිය යුතුය.

(ඉ) නියමිත දිනට පූර්වාසන්න ස්ථිර පත්වීමකට යටත් පිරිසෙන් අවු. 05ක අඛණ්ඩ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතුය.

නමුත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ කළමණාකරන සහකරුවන් ලෙස අභ්‍යන්තර අපේක්ෂකයන් බඳවා ගැනීමේ කළමණාකරන සේවා දෙපාර්තමේන්තුව විසින් එවන ලද DMS/1735/Vol - 1 හා 2021.11.08 දාතම ලිපියෙහි සඳහන් අධ්‍යාපන සුදුසුකම් වන්නේ අ.පො.ස.(සා/පෙළ) සිංහල, දෙමළ, ගණිතය, ඉංග්‍රිසි භාෂාව (තත් කාර්ය සඳහා අවශ්‍ය වන්නේ නම් පමණක්) යන විෂයන් ඇතුළුව විෂයයන් 04 කට සම්මාන සාමාර්ථයන් සහිතව විෂයයන් 06 කින් සමත්ව තිබීය යුතුයි යන්නයි.

ඒ අනුව අදාල ගැටළුව උද්ගත වී ඇති බව කොමිෂන් සභාවට නිරීක්ෂණය වී ඇති අතර, සමුපකාර සංවර්ධන ආයතනයට සමාන ආයතනයක් වන දකුණු පළාත් කාර්මික සංවර්ධන අධිකාරිය හා හෝමියෝපති වෛද්‍ය සභාව වැනි ආයතනවලට අභ්‍යන්තර අයදුම්කරුවන්ගෙන් කළමණාකරන සහකාරවරුන් බඳවා ගැනීමේ ලිහිල් අධ්‍යාපන සුදුසුකම් අනුගමනය කර ඇති බව පෙනේ. කාර්මික සංවර්ධන ආයතනයේ බඳවා ගැනීම් පටිපාටිය කළමණාකරන සේවා දෙපාර්තමේන්තුවේ සහකාර අධ්‍යක්ෂක එම්.ඒ.කරුණාරත්න මහතා විසින් සංශෝධනය කර ඇති අතර, ජාතික සමුපකාර සංවර්ධන ආයතනයේ බඳවා ගැනීම් පටිපාටිය ඔහු විසින් සංශෝධනය කර නැත. හෝමියෝපති වෛද්‍ය සභාවේ බඳවා ගැනීම් පටිපාටිය සහකාර අධ්‍යක්ෂිකා එන්.එන්.අත්තනායක මහත්මිය විසින් සංශෝධනය කර ඇත.

දකුණු පළාත් කාර්මික සංවර්ධන අධිකාරියේ 5.1.2 අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා අධ්‍යාපන සුදුසුකම් දක්වා නොමැති අතර (අ),(ඇ),(ඉ) සඳහා සුදුසුකම් ඇති සේවකයන්ට මේ සඳහා අයදුම්කර හැකිය යන්න සඳහන් වන අතර එහි (අ) සඳහන් අධ්‍යාපන සුදුසුකම් සඳහන් කර නැත.

හෝමියෝපති වෛද්‍ය සභාවේ කළමණාකරන සහකාර තනතුර සඳහා අයදුම් කිරීමේදි "ආ" අනුව අධ්‍යාපන සුදුසුකම් ලෙස සඳහන් කර ඇත්තේ, සිංහල/දෙමළ, ගණිතය, ඉංග්‍රිසි (තත් කාර්යය සඳහා අවශ්‍ය වන්නේ නම්) යන විෂයයන් ඇතුළුව දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් 06 කින් සමත්ව තිබිය යුතු අතර, ඉන් විෂයයන් 03 කට සම්මාන සාමාර්ථ ලබාතිබිය යුතුයි යන්නයි.

රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛණ 25/2016 යටතේ රාජ්‍ය දෙපාර්තමේන්තු හා රාජ්‍ය සංස්ථා ව්‍යාවස්ථාපිත ආයතනවලට කොන්ත්‍රාත්/අනියම්/තාවකාලික සේවකයන් ස්ථිර කිරීමට අදාල චක්‍ර ලේඛණයේ කළමණාකරන සහාකාර වරුන් ස්ථිර කිරීමේදී එම සේවකයන්ට අදාලව ඇ,ඉ,ඊ,උ අනුව අධ්‍යාපන සුදුසුකම් ලෙස දක්වා ඇත්තේ, ගණිතය ඇතුළු විෂයයන් 06කින් සමත්ව තිබිය යුතුයි යන්නයි.

ඉහත කී නිදර්ශනයන් අන්තර්ගත ලේඛණ අනුව නිරීක්ෂණය වනුයේ, සමුපකාර සංවර්ධන ආයතනයේ කළමණාකරන සහකරුවන් බඳවා ගැනීම් පමණක් සංශෝධනය වී නොමැති බවයි. එසේම දකුණු පළාත් කාර්මික සංවර්ධන අධිකාරිය හා හෝමියෝපති වෛද්‍ය සභාවට කළමණාකරන සහකරුවන් බඳවා ගැනීමේදි අභ්‍යන්තර අයදුම්කරුවන් කෙරෙහි ලිහිල් ප්‍රතිපත්තියක් අනුගමනය කර ඇති බවද නිරීක්ෂණය වේ.

පැමිණිලි පාර්ශවය විසින් එකී අසමානතාවය සිදුවී ඇති බවට තම ආයතන ප්‍රධානියා වන ජාතික සමුපකාර සංවර්ධන ආයතනයේ අධ්‍යක්ෂවරයාට දැනුම් දීමෙන් පසු මෙම නිලධාරින්ට සහන සැලසීම සඳහා අධ්‍යාපන සුදුසුකම් අඩු කරන ලෙසත් හා මොවුන්ට පෞද්ගලික වන සේ, උසස්වීම් ලබාදෙන ලෙසත් 2017.01.05 වන දින ලිපියෙන් කළමණාකරන සේවා දෙපාර්තමේන්තුවෙන් ඉල්ලීම් කර ඇත. ඊට අනුමැතිය ලබානොදිම නිසා පැමිණිලි පාර්ශවයේ ඉල්ලීම මත නැවත වතාවක් සාධාරණීය කරන වාර්තාවක් මගින් 2017.08.18 දිනැති ලිපියෙන් ද කළමණාකරන සේවා දෙපාර්තමේන්තුවට දැනුම් දී ඇත. ඊටද අනුමැතිය නොලැබිම නිසා ජාතික සමුපකාර සංවර්ධන ආයතනය කළමණාකරන මණ්ඩල රැස්වීම් - 122/124 තීරණ අනුවද-සුදුසුකම් අඩුකර බඳවා ගන්නා ලෙස කළමණාකරන සේවා දෙපාර්තමේන්තුව වෙත 2019.08.08 හා 2019.12.30 දිනැති ලිපිවලින් ද ඉල්ලීම් කර ඇත.

පැමිණිලි පාර්ශවයන් විසින් 2014.04.30 වන දිනැති ආයතනය ප්‍රතිව්‍යුහගත කරන අවස්ථාවේදී ගණිතය අසමත් අයෙකුටද කළමණාකරන සහකාර තනතුරු ලබාදී ඇති බව සඳහන් කර ඇති මුත්, ඒ පිළිබඳව කොමිෂන් සභාවට නිරීක්ෂණය නොවූ අතර, ඉදිරියේදී ඒ පිළිබඳ අනාවරණය වුවහොත් මානව හිමිකම් කොමිෂන් සභාවේ නිර්දේශය අනුව මොවුනගේ තනතුරු 2014.04.30 වන දින සිට පෙරදාතම් කිරිමට හැකියාවක් ඇති බව තවදුරටත් නිරීක්ෂණය කරමි.

මෙම පැමිණිල්ලට අදාලව මානව හිමිකම් කොමිෂන් සභාව විසින් පවත්වාගෙන යනු ලබන පරීක්ෂණය සඳහා කළමණාකරන සේවා දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කරන ලද යොමු අංක DMS/1735/Vol-1

දරණ 2021.11.08 දාතම ලිඛිත සැලකිරීම අනුව පොල්ගොල්ල ජාතික සමුපකාර සංවර්ධන ආයතනයේ කළමණාකාර සහකාර (තාක්ෂණික නොවන) සේවා ගණයට (MA 1-1) අභ්‍යන්තර අයදුම්කරුවන් ලෙස අයදුම් කිරීම සඳහා අ.පො.ස.(සා.පෙළ) සිහල, ගණිතය හා ඉංග්‍රීසි යන විෂයයන් ඇතුළුව සම්මාන 4ක් සමඟ විෂයයන් 6 කින් සමත්වීම අධ්‍යාපන සුදුසුකම ලෙස දක්වා තිබීම තහවුරු කර ඇත.

එනමුත් දකුණු පලාත් සභාවේ, දකුණු පලාත් කාර්මික සංවර්ධන අධිකාරියේ කළමණාකරන සහකාර (තාක්ෂණික නොවන) සේවා ගණයෙහි අභ්‍යන්තර අයදුම්කරුවන් බඳවා ගැනීමේ දී පොල්ගොල්ල ජාතික සමුපකාර සංවර්ධන ආයතනයේ ඒ හා සමාන තනතුරට අදාල අධ්‍යාපන සුදුසුකම මඟහැර ඇති බව පිළිගන්නා අතර ඉදිරියේ දී එය නිවැරදි කරන බව ද දන්වා ඇත. මානව හිමිකම් උල්ලංඝණයක් වී ඇති බවට පැමිණිලි පාර්ශවය නිදර්ශනයක් ලෙස ඉදිරිපත් කරන කරුණ මේ අනුව සනාථවන අතර නැවත එය නිවැරදිකරන බව ප්‍රකාශ කිරීමෙන් ඉහත කී පැමිණිලිකරුවන්ගේ මානව හිමිකම් උල්ලංඝණය නිවැරදි නොවන බව අප කොමිෂමෙහි නිරීක්ෂණය යි.

දැනට සමුපකාර සංවර්ධන ආයතනයේ කළමණාකරන සහකාරවරුවන් 10/8 ක්ම පුරප්පාඩු පවතින බවත්, ඉන් 06 දෙනෙකු බඳවා ගැනීමට කළමණාකරන සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාදී ඇති අතර, දැනට එම 06 දෙනා බඳවා ගැනීම සඳහා විභාග පවත්වා සම්මුඛ පරීක්ෂණ පවත්වා බඳවා ගැනීම් සිදුකිරීමට නියමිත බවත් පැමිණිලි පාර්ශවය විසින් දැනුම් දීම හේතුවෙන් ඉන් පැමිණිලි පාර්ශවයට අගතියක් සිදුවිය හැකි බවට නිරීක්ෂණය වූ බැවින් බඳවා ගැනීම් තාවකාලිකව අත්හිටුවීමට සමුපකාර සංවර්ධන ආයතනයට කොමිෂන් සභාව විසින් උපදෙස් ලබාදෙන ලදි.

**නිගමනය :**

ඉහත නිරීක්ෂණ අනුව නිගමනය කර සිටින්නේ, සමුපකාර සංවර්ධන ආයතනය හා පැමිණිලි පාර්ශවය විසින් ආදර්ශයට ගෙන ඇති දකුණු පළාත් කාර්මික සංවර්ධන අධිකාරිය හා හෝමෝපති වෛද්‍ය සභාව සමාන ව්‍යවස්ථාපිත ආයතන වන බැවින් එම ආයතන දෙක සඳහා සමාන තනතුරු සඳහා බඳවා ගැනීමේදී, අසමාන ප්‍රතිපත්තියක් කළමණාකරන සේවා දෙපාර්තමේන්තුව විසින් අනුගමනය කර ඇති බවයි.

කළමණාකරන සේවා දෙපාර්තමේන්තුව මගින් සිදුකරන ලද පැහැදිලි කිරීම අනුව දකුණු පළාත් කාර්මික සංවර්ධන අධිකාරිය බඳවා ගැනීම් පටිපාටියේ අධ්‍යාපන සුදුසුකම් මඟ හැරෙන්නේ නම්, හා කළමණාකරන සහකාරවරු බඳවා ගැනීම අනුව සියළු ව්‍යවස්ථාපිත ආයතනවල එකම ප්‍රතිපත්තියක් අනුගමනය කරන්නේ නම්, වෛද්‍ය සභාවේ එකී තනතුරු සඳහා අධ්‍යාපන සුදුසුකම් ලිහිල් කරමින් අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සා/පෙළ) විභාගයේ සිංහල/දෙමළ, ගණිතය, ඉංග්‍රීසි (තත් කාර්යය සඳහා අවශ්‍ය නම්) ඇතුළුව <u>දෙවරකට</u>

නොවැඩි වාර ගණනකදී විෂයයන් 06කින් සමත් විය යුතුයි... යන්න සඳහන් කිරීම පැමිණිලි පාර්ශවිය ආයතනයට අසමාන ලෙස සලකා ඇති බවත්, ඉන් පැමිණිලි පාර්ශවයට අගතියක් සිදුවී ඇති බවත් නිගමනය කරමි.

පළමු වගඋත්තර පාර්ශවය විසින් දකුණු පළාත් කාර්මික සංවර්ධන අධිකාරියේ බඳවා ගැනීම් පටිපාටිය අත්වැරදීමකින් සිදුවුයේ නම්, මෙතෙක් එය සංශෝධනය නොවීම තුලින් ඒ හා සුදුසුකම්ලත් විශාල පිරිසකට අසාධාරණයක් සිදුවී ඇති බවට නිගමනය කරමි.

රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ 25/2014 අනුව කළමණාකරන සහකාරවරුන් බඳවා ගැනීමේදි ලිහිල් ප්‍රතිපත්තියක් මත රාජ්‍ය සමාගම් සඳහා අනුගමනය කරමින් බඳවා ගැනීම් සිදුකර ඇති නමුත් මෙම පැමිණිලි පාර්ශවයන් ස්ථිර තනතුරේ අවු.15 කට වැඩි කාලයක් සේවා කාලයක් තිබියදී සමුපකාර සංවර්ධන ආයතනයේ සාධාරණීය කරන වාර්තා මගින් මොවුන්ට සහනයක් ලබාදීමට අනුමැතිය කිහිපවරක් ඉල්ලීම් කර තිබියදී කළමණාකරන සේවා දෙපාර්තමේන්තුව විසින් ඊට අනුමැතිය ලබානොදීමෙන් පැමිණිලි පාර්ශවයට අගතියක් සිදුකර ඇති බවට නිගමනය කරමි.

**නිර්දේශය :**

ඉහත නිරික්ෂණ හා නිගමන අනුව පැමිණිලිකාර පාර්ශවය විසින් ආදර්ශයට ගෙන ඇති ආයතන දෙකෙහි බඳවා ගැනීමේ පටිපාටිය සලකා බැලීමේදි අගතියක් සිදුව ඇති බවට තහවුරු වන අතර, 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III පරිච්ඡේදයේ 12 (1) ව්‍යවස්ථාවෙන් ප්‍රකාශිත නීතිය පසිඳලීම, ක්‍රියාත්මක කිරීම, නීතියේ රැකවරණය සර්වසාධාරණ විය යුත්තේ ය, යන මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇත.

එබැවින් ජාතික සමුපකාර සංවර්ධන ආයතනය හා සමාන ආයතනයක් ලෙස පිළිගෙන ඇති හෝමියෝපති වෛද්‍ය සභාව සඳහා අභ්‍යන්තර ඉල්ලුම්කරුවන්ගෙන් කළමණාකරන සහකාර තනතුරට බඳවා ගැනීමේ දී ඔබ ආයතනයෙන් අනුමත කොට ප්‍රසිද්ධ කර ඇති සුදුසුකම් ජාතික සමුපකාර සංවර්ධන ආයතනයේ කළමණාකරන සහකාර තනතුර (තාක්ෂණික නොවන) සඳහා අවශ්‍ය වන අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා ද අදාල කරගනිමින් මෙම පැමිණිලි පාර්ශවය එම සුදුසුකම් සපුරා ඇත්තේ නම් එම පැමිණිලිකරුවන් කළමණාකාර සහකාර තනතුරු (තාක්ෂණික නොවන) සඳහා බඳවා ගැනීමට අවශ්‍ය අනුමැතිය ලබාදී ඉහත කී මානව හිමිකම් කඩවීමේ තත්වය ඉවත්කොට සාධාරණය ඉටුකරන ලෙස මෙයින් නිර්දේශ කරමි.

2022. 01 . 20 වන දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත වාර්තාවක් ලැබීමට සලස්වන ලෙසට 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තර පාර්ශවය වෙත මෙයින් දන්වා සිටිමු.

එසේම, එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධයෙන් පැමිණිලි පාර්ශවය විසින් ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාව වෙත දැනුම්දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බව ද වැඩිදුරටත් දන්වමු.

අනුසුයා ෂන්මුගනාදන්,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

**Ms. Anusuya Shanmuganathan**
Commissioner
Human Rights Commissioner of Sri Lanka

ආචාර්ය විජිත නානායක්කාර,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

**Dr. Vijitha Nanayakkara**
Commissioner
Human Rights Commission of Sri Lanka